ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2147/50 - 2019 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2019.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 2019/16.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2018/එච්ඩබ්ලිව්/70.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 448, උඩ අපරැක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩ අපරැක්ක ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2820 හා 2019.09.18 දිනැති සැලැස්මේ කැබලි අංක 01 සහ 02 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0098 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස්:

01. කැබලි අංක 01
ඉඩමේ නම: මගහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රභාත් සෙනෙවිරත්න, බටදොලවත්ත, උඩ අපරැක්ක, අපරැක්ක (හි. පි. 158227 සහ 158228 හි කොටස්. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0018.

02. කැබලි අංක 02
ඉඩමේ නම: කිරිගොඩැල්ලහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු. 5-6 ක් පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නැසී ගිය එච්. කේ. එස්. සී. සිරිවර්ධන, ඉස්කෝලහේන, උඩ අපරැක්ක, අපරැක්ක (හි. පි. 158227 සහ 158228හි කොටස්. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0080.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ

ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.11.20 දින, පූ.භා. 10.00ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.11.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
දෙවිනුවර.

2019 ඔක්තෝබර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
දෙවිනුවර.

11-1034

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.